

# පොඩි ඉඩකඩේ සිටවමු

පලතුරු කන්න නිරෝගිකම රැකගන්න
වස විස වලින් තොර පලතුරු අරගන්න
දේසේ පලතුරට මුල්තැන නිති දෙන්න
හැකි හැම විටම පලතුරු සිටුවා ගන්න

විසිකල ඇටය වුව හැමතැන පැළ වෙන්නේ
සිරිලක දසත පැළ වැවුමට ගැල පෙන්නේ
ඉඩකඩ අනුව පලතුරු තෝරා ගන්නේ
ගැලපෙන ක්‍රමය අනුගමනය කර ගන්නේ

ඉඩකඩ සීමිතයි ගේදොර ඇති හින්දා
ලොකුගස් හදන්නට බෑ අවහිර වන හින්දා
කප්පාදුවෙන් ලොකුගස් පොඩි කළ හින්දා
පලතුරු වවා ගන්නට හැක මන බන්දා

රඹුටන් අඹ පේර වරකා දෙලුම් යසයි
අලිගැටපේර උගුරැස්සද දොඩම් හොඳයි
පැපොල් මෙන්ම නාරං මැංගුස්ද ගුණයි
කෙසෙල් වවමු අවුරුද්දෙම කෑව හැකියි

පොඩි පොඩි ගෙවත්තට පැළ තෝරා ගන්න
දෙකේ දෙකේ වල අඩි දෙක හාරන්න
මතුපිට පසයි ගොම ටිකකුයි මුසුකර ගන්න
වළ පුරවා ඒ මත සිටුවන්න

බාගෙට පිරෙව්වොත් වල කම්මැලි වීලා
වතුර රැඳෙයි මුල් ටික යයි කුණු වීලා
වල කොත ගසලා පුරවා පැළ සිටුවාලා
සරු පැළ ලැබෙයි අලුතින් දළු හෙම දාලා

යන යන විටදී පැළ මිලදී අරගන්නේ
වසරට ලක්ස ගණනිනි පැළ විකිණෙන්නේ
පැළ සිටවුවත් නෑ හරි හැටි සලකන්නේ
සිටුවන පැළ වලින් කීයද හරියන්නේ

ප්‍රමාණවත් පරතරයෙන් පැළ ඉන්දන්න
මුල සිට පැළය පාලනයක් කරගන්න
සෑහෙන පමණ හිරුඑළියත් සලසන්න
උස යා නොදී පැතිරුණු පැළයක් ගන්න

අතු නොබෙදී උස යන පැළ හැදේ නම්
කරටිය කපා අතු බෙදුමට සලයසි නම්
බිම ගෑවෙන අතුත් කපලා දමයි නම්
හැඩවෙන පැළය දෙනවා දෑසට මනරම්

ඇටපැළ සිටුවීම නොකරමු දැන් වත් ඔන්න
වෙන වෙන වර්ග ලැබෙනා බව පිළිගන්න
අස්වනු ලැබෙන්නට කල් යනවා ඔන්න
සිටුවීමට බද්ධ පැළම අරගන්න

ඇටපැළ සිටෙව්වොත් කරදර ගෙන දෙනවා
පිරිමි ගසුත් ඒවායින් ඇති වෙනවා
ලස්සන ගහක් ගන්නට නොම හැකි වෙනවා
ගුණයෙන් යුක්ත ඵලදාවක් නැති වෙනවා

බද්ධ පැළෙන් පොඩි ගසක්ය ඇති වන්නේ
අතු පැතිරිලා හැඩ වැඩ ගසකිය දෙන්නේ
කෙටි කලකින්ම ඵලදාවත් ලැබ දෙන්නේ
ඵලදාවත් රැකගැනුමට හැකි වන්නේ



# පලතුරු සතොසේ

කප්පාදුවෙන් ගස හැඩ වැඩ කර ගන්නේ
ගස මැද තිබෙන අතු බලලා කපන්නේ
ලෙඩවෙන මැරෙන අතු කපන්නේ
ගස මැද්දට හිරුට එන්නට ඉඩ දෙන්නේ

දිය රිකිල්ල නෑ නොවැ මල් එල දෙන්නේ
වැඩි කොළදාව ඇතිවිට මල් අඩු වන්නේ
ගස තුළ සෙවන ලෙඩ ටික වැඩිකර දෙන්නේ
කප්පාදුවෙන් ප්‍රතිඵල අත්කර ගන්නේ

ගස මුල පසට සිමෙන්ති ආදිය නොදෙමු
ගස යට මල්පෝච්චි නොතබා සහය වෙමු
නිතර නිතර ගස යට තෙත් නොකර ගමු
නිසි කාලයට මල් එල ටික නෙලා ගමු

ගොම කොම්පෝස්ට් කොළ පොහොරද හිතකරය
වැඩි වුනොතින් හැදෙයි අතුටික දළු වැඩිය
මල් එලදාව අඩු වෙනවා ගෙඩි අඩුය
සමතුලිතව පොහොර යෙදුවොත් මල් සරුය

ගස හැම තැනම මල් පොකුරින් බර වන්න
අකාලයේ ගැට වැටීම අඩු කර ගන්න
හැදෙන සියලු ගෙඩි පෙනුමින් සරු වන්න
අංශුමාත්තර පොහොරද සපයන්න

මල් දලු කලුවෙලා වියලී යනවා නම්
තිත් ඇතිවෙලා ගෙඩි කොළ හෙම වැටේ නම්
දිලීරයන් කාමියන් ඇති බව සැක නම්
සුදුසුය මර්ධනය යොදලා සුදුසු යෙදුම්

ගෙඩි ටික හැදෙන විට මැස්සන් විදින්නේ
අකාලයේ වැටිලා කුණුවී යන්නේ
ඉදුනට පසුව ඇතුලේ පණුවන් ඉන්නේ
කොහොමද අනේ මේ ගෙඩි ටික රැකගන්නේ

ගස් පොඩි නිසා යෙදුමට හැක ආවරණ
ගැට කාලයේ එය කෙරුවොත් හරි ඔන්න
ඝණ කඩදාසි මළු හදලා පලදන්න
මැස්සන් ඇවිත් හැරිලා යනවා ඔන්න

පරිසරයේ සිටින පලතුරු මැස්සන් අල්ලන්න
ඇම උගුලක් තියන්නට හිත දෙන්න
වැටෙන ගෙඩි සැවොම කලු මල්ලක ලන්න
නිතර නිතර අලුතින් ඇම තබන්න

සමහර අයගෙ ගස්වල මල් නැහැ එන්නේ
මොනවා කරන්නද කියලයි අසන්නේ
පරිසර හේතු පොහොරද බල හන්නේ
හෝර්මෝනද ඇතිය දැම්මොත් මල් එන්නේ

මල් පමණක්ය අපේ ගසේහී හැදෙන්නේ
ඒවායින් නැතිය ගෙඩි එහෙමත් හැදෙන්නේ
අසනා අය නිතර අපවයි අමතන්නේ
පිරමි ගසක් විය හැකි බව දැනගන්නේ

කවියට නැගුවේ,
**කේ. ජී. එස්. සෙනෙවිරත්න**
සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)
පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය
ගන්නොරුව, පේරාදෙණිය

**National Digitization Project**

***National Science Foundation***

Institute : Department of Agriculture

1. Place of Scanning : Department of Agriculture, Peradeniya
2. Date Scanned : 2018/01/08
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N. S. Karunarathna

Signature : Sithara

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Chief Librarian

Name : Saumya Upamalika

Signature :

Date : 2018/01/08

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*